# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2015 ජනවාරි මස 20 දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. **ගරු කේ. ඩී. අරුණ දිපාල් මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යොවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදාහැරීම්, සමුපකාර සංවර්ධන, ග්‍රාම ආර්ථික ප්‍රවර්ධන ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් 2014.12.01 දින අසන ලද ප්‍රශ්ණය:**

(ප්‍ර/VI (1) /14/59)

අ. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ තනතුරු පුරප්පාඩු සම්බන්ධයෙන් පරිපාලන චක්‍රලේඛන අංක 03 මගින් මෙම වර්ෂයට අදලව තනතුරු වර්ග 06 ක් සදහා අයදුම්පත් කැඳවීමක් කලේද?

ආ. එකී එක් එක් තනතුර සදහා අයදුම්කල අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ නම් ඉදිරිපත්කර අදල සම්මුඛ පරීක්ෂණයේදි එම අය වෙන් වෙන්ව ලබාගත් ලකුණු ප්‍රමාණය මෙම සභාවට ඉදිරිපත් කල හැක්කේද?

ඇ, නොඑසේ නම් ඒ මන්ද?

ඈ, අදල සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියේදි, බරපතල අකටයුතු අසාධාරණකම් සහ වංචාවන් සිදුවී ඇති බව ඔබතුමා දන්නේද?

ඉ. එසේ දන්නේ නම් ඒ මොනවාද? කා ගටද?

ඊ, විෂය භාර අමාත්‍යවරයා ලෙස මෙම බරපතල විෂමාචාරයන් නිවැරදි කිරීමට ගෙන ඇති පියවර හා ක්‍රියාමාර්ග කවරේද?

02. ගරු කේ. ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්‍ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2014.12.01 දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /14/62)

අ. බස්නාහිර පළාත තුල උගස් ආයතන කොපමණ සංඛ්‍යාවක් පවත්වා ගෙන යන්නේද?

ආ. එම ව්‍යාපාර නම් වශයෙන් දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් වෙන් වෙන් වශයෙන් දැක්වීමට කටයුතු කරන්නේද?

ඇ. බලපත්‍ර රහිතව පවත්වා ගෙන යනු ලබන උගස් ආයතන ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ඈ. එක් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් බලපත්‍ර රහිතව පවත්වා ගෙන යන ආයතන කවරේද?

ඉ. එකී ආයතන සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද?

ඊ. ඒ ආයතන සම්බන්ධයෙන් ඔබතුමා සහ ඔබතුමා යටතේ වන ආයතන ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?

උ. උගස් ආයතන වාර්ෂික බලපත්‍ර මගින් මෙම වර්ෂයේ ලැබී ඇති ආදායම කොපමනද?

ඌ. 2015 වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනයේ ආදායම් ලැබීම් යටතට මෙම ආයතන මගින් අපේක්ෂිත ආදායම කොපමනද?

එ. එම මුදල අයකර ගැනිමට යෝජිත වැඩපිළිවෙල කුමක්ද?

03. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්‍ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2014.12.01 දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /14/63)

අ) මිනුවන්ගොඩ,මීගමුව,කැළණිය,කළුතර,හොරණ,හා මතුගම අධ්‍යාපන කලාප තුල පළාත් සහ පාසල් ගණන කලාප මට්ටමෙන් වෙන් වෙන්ව. කීයද?

ආ) එම පාසල්වල 2,3,4 හා 5 ශ්‍රේනි වල අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව , කලාප මට්ටමින් වෙන් වෙන්ව කියද?

ඇ) පාසල් හා ශ්‍රේණි වලට අනුව කියවීමට හා ලිවීමට නොහැකි ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් එක් එක් කලාප මට්ටමෙන් ලබා දෙන්නේද?

ඈ) නො එසේනම් ඒ මන්ද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව:

"අද දින (2015-01-20 දින) විසිර යැමෙන් අනතුරුව, මෙම සභාව 2015 පෙබරවාරි මස 02 වන දින (සඳුදා දින) පෙ.ව. 9.30 ට රැස්විය යුතු අතර,2015.02.03 - (අඟහරුවාදා දිනය)- සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයක් ලෙස සළකා ක්‍රියා කළ යුතුය."

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා:

'ඔන් ලයින් ලොතරැයි ව්‍යාපාරය 2014 අප්‍රේල් මස මුල් සතියේ සිට ක්‍රියාත්මක වන අතර. එහි මූලස්ථානය කොළඹ 02 නවම් මාවතෙහි පිහිටා ඇත. තවද රට පුරා එවැනි මධ්‍යස්ථාන 3000 ක් ස්ථාපිත කිරීමට සූදානම් කර ඇත. මෙය ලොතරැයියක මුවාවෙන් වන සූදුවක් වන අතර, රටේ තරුණ පරපුර මේ වීගයෙන් රට ඇබ්බැහි වෙමින් පවතී. එහි ඇති වඩාත් භයානකකම වන්නේ මේ තුළ ලොටෝ සහ ජැක්පොට් යන ක්‍රීඩාවන්ද අන්තර්ගත වීම සහ නිවසේ සිටද මෙම ලොතරැයි සමග ක්‍රියා කළ හැකි වීමයි. මෙවැනි උවදුරකින් බස්නාහිර පළාතේ ජනතාව මුදා ගැනීම මෙම පළාත් සභාවේ ප්‍රමුඛතම යුතුකම හා වගකීමද වන බැවින් මෙවැනි ව්‍යාපාර වලට ආධාර අනුබල නොදීමට සියළු වගකිව යුතු පුද්ගලයන් සහ ආයතන වගබලා ගත යුතු 'යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි '

(යෝ/VI (1) 14/06)

02. ගරු එම්. රෝය් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය;

'බස්නාහිර පළාත තුළ පිහිටි ඇතැම් අධිකරණ බල සීමා නැවත නිර්ණය කර, නව අධිකරණ කලාපවලට වෙන් කිරීමටත්,ඒ අනුව කාර්ය භාරයයන් පැවරීමටත්, රජය කටයුතු කර ඇතත් ,එහිදී නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම නිසා ජනතාවට විවිධ අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුව ඇතිවා මෙන්ම, විශාල මුදල් ප්‍රමාණයක් නාස්ති වීමක් ද සිදු වේ. ජනතාවට, පොලිස් නිලධාරින්ට මෙන්ම අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ට ඉතා සමීප අධිකරණයක් තිබියදී වාහන සඳහා ඉන්ධන වැය කරමින් දුරින් පිහිටි අධිකරණය සඳහා ගමන් කිරීමට සිදුව ඇත, එබැවින් මෙම සියලු කරුණු නිසි අධීක්ෂණයකට යටත් කොට, නිසි අත්දැකීම් ඇති නිලධාරින්ගෙන් සංයුක්ත කමිටුවක් මගින්, ශ්‍රී ලංකාව තුළ අධිකරණ බල සීමා නැවත නිර්ණය කිරීම ක්‍රමවත්ව සිදු කළ යුතු 'යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කරයි '

(යෝ/VI (i) 14/07)

## XI. සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.01.05 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.